# තිත්පළගැටියා (Aularches miliaris)

ගන්නෝරුව පැලෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ
**විෂයභාර නිලධාරී වයි.එම්. සමරකෝන් බංඩාර විසිනි.**

කහ තිත් පලගැටියා ශ්‍රී ලංකාවේ මුලින්ම වාර්තා වී ඇත්තේ 1861 දී පමණ තංගල්ල ප්‍රදේශයෙනි. අවුරුදු 100 කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකාවේ හඳුනාගෙන ඇති මෙම කෘමියා ස්ථිර බෝග වගාවට ආර්ථිකව හානි කරන බව මුලින්ම ගන්නෝරුව පැලෑටි සංරක්ෂණ සේවය වෙත වාර්තා වී ඇත්තේ 1974 මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙනිය ප්‍රදේශයෙනි. තවද, 1979 කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශයෙන් ද, 1983 මාතලේ ඇල්කඩුව ප්‍රදේශයෙන් ද, 1987 නුවරඑළිය ගිනිගත්හේන ප්‍රදේශයෙන් ද වාර්තා වී ඇත.

ඉහත සඳහන් දිස්ත්‍රික්කවල දළ වශයෙන් වාර්ෂිකව හෙක්ටයාර් 100 කට පමණ හානි කරන බව මෑත කාලයේ වාර්තා වලින් පැහැදිලි වේ. මේ මගින් වැඩි ප්‍රතිශතයක් අයත්වන්නේ උඩරට ස්ථිර බෝග වගා භූමි වලටයි. ස්වාභාවික වනාන්තර කෘෂිකර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගැනීම හේතුවෙන් තිත්පළගැටියා කෘෂි බෝග වගාවට සංක්‍රමනය වී ඇති බව අනුමාන කල හැකිය. වල් ඌරන් විසින් තිත් පළගැටියන්ගේ බිත්තර ආහාරයට ගැනීම හේතුවෙන් තිත් පළගැටියන්ගේ ගහනය බොහෝ දුරට පාලනය වන බව මහනුවර දිස්ත්‍රික්කයේ වටගොඩ හා සීවලිකන්ද ප්‍රදේශයේ කරන ලද නිරීක්ෂණ වලින් පෙනී ගොස් ඇත.


උඩරට ස්ථිර බෝග වගාවේ දක්නට ඇති ශාක අතර, හවරි නුග (Alstonia maero phyta) ගිණිසපු (Michelica champaca) වනසපු (Cananga Odavata) පොල් (Cocus nucifera) පුවක් (Areca catechu) කෙසෙල් Musa acuminata) ශාක වලට විශාල වශයෙන් හානි කරන අතර, තේ (Camellia sinensis) කෝපි Coffea arabica) ග්ලිරිසීඩියා (Glirisidia Makulata) වලට වැඩි කැමැත්තක් නොදක්වයි. ආහාර සඳහා විශාල පරාසයක් ඇති මෙම කෘමීන් ආහාර නොමැතිව එකට සිටින විට තම වර්ගයාගේ පිහාටු පවා ආහාරයට ගනී.

තිත් පළගැටියා සුහුඹුල් අවස්ථාවට පත්වූවිට මර්ධන කටයුතු ආරම්භ කිරීමට බොහෝදෙනා පෙළඹේ. මෙම අවධියේ කෘමීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ඉතා ඉහළ ශාක වියන මත පත්‍ර ආහාරයට ගනී. මෙම අවස්ථාවේ කෘමි පාලනය කිරීම ප්‍රායෝගික නොවේ. තවද ඉතා ඉහල ශාක වියන මතට කෘමිනාශක යෙදීම අධික වියදම් සහිත වන අතර, පරිසරයටද විශාල වශයෙන් අහිතකර වේ.

එම නිසා තිත් පලගැටියාගේ ජීවන චක්‍රයේ අවධිය පිළිබඳ විමසිලිවත්ව බලා සුදුසු අවස්ථාවල මර්ධන ක්‍රම අනුගමනය කිරීම වඩාත් ප්‍රායෝගික වේ.

## ජීවන චක්‍රය

කහතිත් පළගැටියා ඕතොප්ටෙරා (ORTHOPTERA) ගෝත්‍රයට හා ඇක්රිඩියේ (ACRIDIAE) පවුලට අයත් අතර, සුහුඹුලා මි.මී.45 - 60 පමණ දිග වේ. සුහුඹුලාගේ පියාපත් යුගල 2 ක් ඇත. ඉදිරි පියාපත ඝනකම් වන අතර, කොළ පැහැතිය. මෙහි කහපාට තිත් 15 - 25 ප්‍රමාණයක් දක්නට ඇත. පසුපස පියාපත පටලමය වන අතර, ඉදිරි පියාපතින් වැසී ඇත. මාස




2 - 3 ක කාලයක් ජීවත් වන අතර, බිත්තර දමා දින කිහිපයකින් කෘමීන්ගේ ජීවන කාලය අවසන් වේ.

## බිත්තර

ඔක්තෝම්බර්, නොවැම්බර් සුහුඹුල් ගැහැණු සතුන් බිත්තර දැමීම ආරම්භ කරයි. මේ සඳහා සියළුම සුහුඹුල් සතුන් ඉතා විශාල ශාක මගින් පොලොව මතට පැමිණ සෙවන සහිත ස්ථාන වල විශාල රංචු වශයෙන් එකතු වේ. මෙම අවස්ථාවේ දී පිරිමි සතුන් හා යුගල වශයෙන් සිටීමද දැකිය හැකිය.

බිත්තර දැමීම සඳහා පොලොවෙහි සෙවන ඇති ස්ථානවලට වඩාත් ප්‍රිය කරන අතර, ගැහැණු සතාගේ උදරය මගින් පසේ සෙ.මී. 1 විශ්කම්භය ඇති සෙ.මී. 7 ගැඹුර ඇති සිදුරක් සාදාගනු ලබයි. මෙහි බිත්තර 70-80 ක් තැන්පත් කරන අතර ඒ සමගම ශ්‍රාවය කරන සුදු පැහැති පෙන ද්‍රව්‍යයක් මගින් බිත්තර ආවරණය කරනු ලබයි. ස්වල්ප වේලාවකින් මෙම ආවරණය රෝස පැහැයට හැරී ඝන වේ. මෙය ජලයට අපාරගම්‍ය වන අතර, බිත්තර කැදල්ල ආරක්ෂාකාරී වීමට උපකාරී වේ. බිත්තර දැමීම අවසානයේ බිත්තර කැදැල්ල සෙ.මි. 1 ක් පමණ පස් තට්ටුවකින් ආවරණය කරන නිසා බිත්තර දමන ස්ථාන පහසුවෙන් හඳුනා ගැනීමට අපහසු වේ.

ජනවාරි, මාර්තුමාස වන විට තැන්පත් කර ඇති බිත්තර වල බිජෞෂණ කාලය අවසන් වී බිත්තර වලින් පිටතට පැමිණෙන ශිෂුවන් ශිෂු අවධි 5 ක් ගත කර සුහුඹුලන් බවට පත් වේ.

## ශිෂු අවස්ථාව

ජනවාරි, මාර්තු මාස වන විට පොලොවෙහි තැන්පත් කර ඇති බිත්තර වල බිජෞෂණ කාලය අවසාන වී මුලික ශිෂුවන් පිටතට පැමිණේ. එම ශිෂුවන් ශිෂු අවධි 5 ක් ගතකර සුහුඹුලන් බවට පත් වේ.

බිත්තර කැදැල්ලකින් පැය 1 /2 කාලයකදී සියළුම ශිෂුවන් පිටතට පැමිණේ. මෙම ශිෂුවන් රෝස පැහැවන අතර. පැය කිහිපයකදී කළු පැහැයට හැරේ. බිත්තර වලින් පිටතට පැමිණෙන ශිෂුවන් මංඩි වශයෙන් බිත්තර කැදැල්ලේ පිටවූ ස්ථාන වල සිට ක්‍රමයෙන් ඉතා කුඩා පඳුරු මතට ගමන් කරයි. පළමු ශිෂු අවධිය සති 2 - 3 ගත කරන අතර. අගෝස්තු මස අවසාන භාගය වන විට ශිෂු අවධි සියල්ල පසු කර සියළුම සතුන් සුහුඹුලන් බවට පත් වේ.

ජූනි. ජූලි. අගෝස්තු මාස වල ශිෂුවන්ගේ වැඩි ප්‍රතිශතයක් 3,4,5 ශිෂු අවස්ථා වලට පත්වන අතර. මෙම කෘමීන් බොහෝ විට ශාකවල කඳක් දිගේ ඉහළට ගමන් කරති. සැප්තැම්බර් - ඔක්තෝබර් මාස වල සුහුඹුලන්ගේ වැඩි කොටසක් ඉහල ශාක වියන මත වැඩි වශයෙන් ගත කරයි.

## සංක්‍රමනය

සංක්‍රමනය ප්‍රධාන වශයෙන් ක්‍රම හතරකට සිදු කරනු ලබයි.

1. ගමන් කිරීම
2. ඉහලට නැගීම
3. පැනීම
4. ඉගිලීම

1. ගමන් කිරීම

ගමන් කිරීම බිත්තර වලින් පිටවන සතුන් සංක්‍රමනය වන්නේ ඇවිදීම මගින්. ආහාර ගැනීම සඳහා ගමන් කිරීම කරයි. මේ සඳහා පාද යුගල් තුනම උපයෝගී කරගනු ලැබේ.

2. ඉහළට නැගීම

මේ සඳහා භාවිතා කරනු ලබන්නේ ඉදිරිපාද යුගල දෙක පමණි. විශේෂයෙන් ඉහලට නැගීම සිදු කරනු ලබන්නේ ආහාර රැයාදා ගැනීම හා ලැගීම සඳහා ය.

3. පැනීම

හදිසි තිගැස්මකදී හා ඉහල සිට පහලට පැමිණීමට අවශ්‍ය අවස්ථා වලදී පැනීම කරනු ලබයි. පැනීම සඳහා විශේෂයෙන් අපර ගාත්‍රා සැකසී ඇත. සියළුම ශිෂු අවස්ථාවල හා සුහුඹුල් අවස්ථා වලදී පැනීම මගින් සංක්‍රමනය වේ.

4. ඉගිලීම

සුහුඹුල් සතුන් ඉහල ශාක වියන මත සිට වෙනත් ස්ථාන කරා වරකට ඉගිලීමට හැකියාවක් ඇත. වරකට මී. 30-40 ඉගිලේ.

## පාලනය කිරීම

තිත් පලගැටියාගේ ජීවන චක්‍රයේ විවිධ වාර්ෂික අවධි හඳුනාගෙන ඒ අනුව ගැලපෙන පාලන කටයුතු දියත් කිරීම වඩාත් ප්‍රායෝගික වේ.

1. සුහුඹුල් සතුන්

ඔක්තෝබර් - නොවැම්බර් කාලයේ වැඩිපුර සතුන් බිත්තර දැමීම සඳහා පොලවේ සෙවන ඇති ස්ථාන වලට රංචු වශයෙන් ඒකරාශි වේ. එම ස්ථාන හඳුනාගෙන (1) කෘමිනාශක යෙදීම. (2) එකතු කර විනාශ කිරීම. (3) පිළිස්සීම මගින් පාලනය කර ගත හැකිය.

2. බිත්තර


ඔක්තෝබර් - නොවැම්බර් මාස වල දමන ලද බිත්තර දමන ස්ථාන සලකුණු කර ජනවාරි අතර. කාලයේ එම ස්ථාන වල ඇති පස අඟල් 4 - 6 පමණ ගැඹුරට අවුස්සා පරිසරය නිරාවරණය කර වියළීමට හැරීම හා විනාශ කිරීම.

3. ශිෂුවන්

ජනවාරි - මාර්තු මාස වල බිත්තර වලින් පිටවන මුලික ශිෂු අවස්ථාවන් පොලොවට ආසන්නයේ පොකුරු වශයෙන් කුඩා ශාක මත ජීවත්වන බැවින්. එම ස්ථාන වලට කෘමිනාශක යොදා විනාශ කිරීම.

නිර්දේශක කෘමිනාශකය - කාබරිල් - අක්කර 1 කට කි.ග්‍රෑ. 01

තිත් පළගැටියන් ස්ථිර බෝග වගාවේ තම ජීවන කාලය තුල සංක්‍රමනය වන බැවින්. මේ පිළිබඳව සුපරීක්ෂාකාරී වීම වැදගත් වේ. තිත් පළගැටියන් ඇති ප්‍රදේශ වල ගොවීන් වර්ෂ කිහිපයකත් සාමුහිකව වැඩ සටහන් ක්‍රියාත්මක කර පාලනය කිරීම වඩාත් ප්‍රතිඵල සහිත වේ.




**වර්ෂය තුළ තිත් පළගැටියාගේ වර්ධක අවධි පැතිරීම හා පාලන පිළිවෙත් අනුගමනය කලයුතු කාලය**